සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව
சமுர்த்தி அபிவிருத்தி திணைக்களம்
**Department of Samurdhi Development**
ග්‍රාමීය සංවර්ධන , සමාජ ආරක්ෂණ සහ ප්‍රජා සවිබලගැන්වීම් අමාත්‍යාංශය
கிராமிய அபிவிருத்தி, சமூகப் பாதுகாப்பு மற்றும் சமூக வலுவூட்டுகை அமைச்சு
Ministry of Rural Development, Social Security and Community Empowerment


මගේ අංකය / எனது இல / My No: DSD/HO/MF/05/08/01/ චක්‍රලේඛ

ඔබේ අංකය / உமது இல / Your No: ...........................................

දිනය / திகதி / Date: 2025.03.06

**සමෘද්ධි ප්‍රජාමූල බැංකු චක්‍රලේඛ අංක - 2025/05**

සියළුම සමෘද්ධි ප්‍රජාමූල බැංකු පාලක මණ්ඩල/බැංකු සමිති විධායක කමිටු සභාපතිවරුන්,
සමෘද්ධි ප්‍රජාමූල බැංකු කළමනාකරුවන්/බැංකු සමිති කළමනාකරුවන්,

**<u>ක්ෂේත්‍රගත සමෘද්ධි සංවර්ධන නිලධාරින්ගේ මාසික කාර්යාල දීමනාව සංශෝධනය කිරීම.</u>**

01. ග්‍රාම නිලධාරි වසම් වලට අනුයුක්ත ක්ෂේත්‍රගත සමෘද්ධි සංවර්ධන නිලධාරින්ගේ මාසික කාර්යාල දීමනාව සංශෝධනය කිරීම සඳහා 2025.02.25 දින පැවති සමෘද්ධි ප්‍රජාමූල බැංකු හා බැංකු සමිති කළමනාකරණ මණ්ඩල තීරණ අංක 2025/134/11 යටතේ අනුමැතිය ලබා දී ඇත.

02. දැනට මහා භාණ්ඩාගාර ප්‍රතිපාදන යටතේ නිලධාරියෙකුට ගෙවන මාසික කාර්යාල දීමනාව රු.500/- ක් වන අතර, එම මාසික දීමනාව පහත පරිදි නගර සභා හා ප්‍රාදේශීය සභා බල ප්‍රදේශ අනුව සංශෝධනය කිරීම කරනු ලබයි.

| | |
|---|---|
| මහ නගර/නගර සභා බල ප්‍රදේශ සීමාව තුල | - රු.3000/- |
| ප්‍රාදේශීය සභා බල ප්‍රදේශ සීමාව තුල | - රු.2000/- |

03. මෙම සංශෝධනය කිරීමත් සමඟ වැඩිවන මුදල, සමෘද්ධි ප්‍රජාමූල බැංකුවේ ග්‍රාමීය ණය අවශෝෂ්‍යතා අරමුදලින් (කේත අංක 4033) ගෙවිය යුතුය. එම මාසික දීමනාව එක් එක් නිලධාරියාගේ පුද්ගලික ඉතිරි කිරීම් ගිණුමට මාසිකව බැර කර ගෙවීම් කල යුතුය.
ගිණුම් සටහන වනුයේ,

| | | |
|---|---|---|
| ග්‍රාමීය ණය අවශෝෂ්‍යතා අරමුදල් ගිණුම | - | හර (කේත අංකය 4033) |
| දිරියමාතා/සාමාජික නොවන ඉතිරි කිරීමේ ගිණුම | - | බැර |

04. ග්‍රාමීය ණය අවශෝෂ්‍යතා අරමුදල් ගිණුමේ ප්‍රමාණවත් මුදල් නොමැති බැංකු විසින් මෙම දීමනාව සඳහා බැංකු අරමුදල් භාවිතා කල යුතුය. ඒ සඳහා ගිණුම් සටහන වනුයේ

| | |
|---|---|
| වැය ගිණුම - ගොඩනැගිලි කුලී ගිණුම් (හර කේත අංක 2115) | - හර |
| දිරිය මාතා/සාමාජික නොවන ඉතිරි කිරීම් ගිණුම | - බැර |

05. රජය සතු හෝ රජයේ අරමුදලින් ඉදිකර ලබාදෙන කාර්යාල හෝ පුද්ගලයින් /සංවිධානයක් විසින් කුලී මුදලක් ලබා නොගෙන කාර්යාල පහසුකම් පවත්වා ගැනීමට ඉඩදී ඇති අවස්ථාවලදී මෙම මාසික දීමනාව ඒ ඒ නිලධාරින්ට ලබා නොදිය යුතුය. තවද, මෙම ගෙවීම් කිරීමට පෙර, කාර්යාලයක් පවත්වාගෙන යන බවට කළමනාකරු සෑහීමකට පත් විය යුතුය.


1වන අදියර,4 වන මහල , සෙත්සිරිපාය , බත්තරමුල්ල. / 1ம் கட்டம், 4 வது மாடி,செத்சிறிபாய பத்தரமுல்ல / 1st Step, 4 th floor, Sethsiripaya Battaramulla

| | අධ්‍යක්ෂ ජනරාල් / பணிப்பாளர் தலைமையதிபதி / Director General | අතිරේක අධ්‍යක්ෂ ජනරාල් (පාලන හා ආයතන) / மேலதிக பணிப்பாளர் தலைமையதிபதி ( நிர்வாகம்/தாபனம்) / Additional Director General (Admin & Establishment) | ප්‍රධාන ගණකාධිකාරී / பிரதான கணக்காளர் / Chief Accountant | අධ්‍යක්ෂ (ක්ෂුද්‍ර මූල්‍ය) / பணிப்பாளர் (குறு நிதி ) / Director (Micro Finance) | කාර්යාලය / அலுவலகம் / Office |
|---|---|---|---|---|---|
| Tel- | 011-2869824 | 011-2873799 | 011-2869742 | 011-2889003 | 0112872202 |
| Fax - | 011-2889002 | 011-2873996 | 011-2869742 | 011-2887469 | |
| E-mail- | dgsamurdhi@gmail.com | diradmin@samurdhi.gov.lk | finance@samurdhi.gov.lk | | |
| | | **Hot Line :0112-889007** | | **Hot Line:0112-885582** | **Hot Line: 011- 2887722** |

06. යම් නිලධාරියෙකු නිත්‍ය රාජකාරි වසම හැර වෙනත් ග්‍රාම නිලධාරි වසමක වැඩ බලන විටක හා කාර්යාලයන් පවත්වාගෙන යන්නේ නම්, මෙම දීමනාව ලබාදීම කල යුතුය. එය වැඩබලන එක් වසමක් සඳහා පමණක් අදාල කරගත යුතුය.

07. රජය මඟින් ලබාදෙන රු.500/-ක මාසික දීමනාව, ප්‍රාදේශීය සමෘද්ධි මූලස්ථානය මඟින් ලබාදීම දැනට පවතින ක්‍රමවේදය යටතේ ලබාදෙන අතර, මෙම කාර්යය සඳහා බැංකුව විසින් වැඩිවූ මුදල (නගර සභා සීමාව සඳහා රු.2500 සහ ප්‍රාදේශීය සභා සීමාව සඳහා රු.1500) මාසිකව එම නිලධාරින්ට ලබාදීම සිදුකල යුතුය. මෙම කාර්යය සඳහා මහා භාණ්ඩාගාරයෙන් සම්පූර්ණ මුදල සඳහා ප්‍රතිපාදන ලැබෙන තෙක් පමණක් මෙම උපදෙස් ක්‍රියාත්මක කල යුතුය.

08. ඉහත දීමනාව සංශෝධනය 2025 මාර්තු 01 දින බල පැවැත්වෙන බවත් දන්වමි.

සී.ඩී.කළුආරච්චි
අධ්‍යක්ෂ ජනරාල්

පිටපත්

1. ලේකම්, ග්‍රාමීය සංවර්ධන, සමාජ ආරක්ෂණ සහ ප්‍රජා සවිබලගැන්වීම් අමාත්‍යංශය -කා.දැ.පි.
2. සියලුම දිස්ත්‍රික් ලේකම්වරුන්/දිස්ත්‍රික් සමෘද්ධි අතිරේක අධ්‍යක්ෂ ජනරාල්වරුන්
   - දිස්ත්‍රික් ලේකම් කාර්යාලය - කා.දැ.පි.
3. අතිරේක අධ්‍යක්ෂ ජනරාල්, පාලන සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව - කා.දැ.පි හා .අ.ක.ස.
4. ප්‍රධාන ගණකාධිකාරි, සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව - අවශ්‍ය ප්‍රතිපාදන ගෙන්වා ගැනීම පිණිස
5. ප්‍රධාන අභ්‍යන්තර විගණක, සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව - කා.දැ.පි.
6. සියලුම දිස්ත්‍රික් සමෘද්ධි අධ්‍යක්ෂවරුන්, දිස්ත්‍රික් ලේකම් කාර්යාලය - කා.දැ.පි.
7. සියලුම ප්‍රාදේශීය ලේකම්වරුන්, ප්‍රාදේශීය ලේකම් කාර්යාලය - කා.දැ.පි.